*The Journal of Archaeology and Heritage Studies*

Department of Archaeology and Heritage Management,
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka,
Mihintale.

Volume 7 Issue I, II & III

## ලිපි ඉදිරිපත් කිරීමේ සම්මතයන්

**විෂය ක්ෂේත්‍රය** - පුරාවිද්‍යාව, ඉතිහාසය, උරුම කළමනාකරණය, ස්මාරක හා පුරාකෘති සංරක්ෂණය, පුරාණ වාස්තුවිද්‍යාව, පැරණි වාරිකර්ම, පැරණි තාක්ෂණය, අභිලේඛන හා පුරා අක්ෂර විද්‍යාව, සංස්කෘතික මානවවිද්‍යාව, මානවවංශ පුරාවිද්‍යාව, ජලාශ්‍රිත පුරාවිද්‍යාව හා සංචාරක ඇතුළු පුරාවිද්‍යාව ආශ්‍රිත වෙනත් විෂයයන්

**භාෂාව** : සිංහල / English

**අකුරු මාදිළිය** : සිංහල - FMAbhaya ඉංග්‍රීසි - Times New Roman

**අකුරු ප්‍රමාණය** : ප්‍රධාන මාතෘකා - 16/ Bold, අනු මාතෘකා - 14 / Bold, අන්තර්ගතය - 12

**ප්‍රමාණය** : වචන 3,000-3,500 (අන්තර්ගතය අනුව වෙනස් විය හැකිය)

**පර්යේෂණ පත්‍රිකාව -**

**පූර්ව කොටස** - මාතෘකාව, කර්තෘ විස්තර (නම, අධ්‍යාපන සුදුසුකම්, තනතුර, ආයතනය හා තැපැල් ලිපිනය) සංක්ෂිප්තය, මුඛ්‍ය පද

**මධ්‍ය කොටස** - හැඳින්වීම, ක්‍රමවේදය, ප්‍රතිඵල හා සාකච්ඡා, නිගමන හෝ සමාලෝචන (අවශ්‍ය නම් පමණක්)

**අපර කොටස** - උපකාරානුස්මෘතිය, මූලාශ්‍ර

**පූර්ව කොටස -**

මාතෘකාව - පර්යේෂණයට අදාළවූත්, අනන්‍යවූත්, සංක්ෂිප්තවූත් එකක් විය යුතුය.

කතෘ විස්තරය - කතුවරයාගේ/කතුවරුන්ගේ සම්පූර්ණ නම දැක්විය යුතුය. කතුවරු කිහිපදෙනෙකු වේ නම් ප්‍රධාන කතුවරයාගේ විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළු අනෙකුත් තොරතුරු කර්තෘ විස්තරය අවසානයේ දැක්විය යුතුවේ.

පර්යේෂණ සංක්ෂිප්තය - වචන 250-300 අතර ප්‍රමාණයේ පර්යේෂණ සංක්ෂිප්තයක් (abstract) විය යුතු අතර මාතෘකා නොමැති එක් පරිච්ඡේදයක් ලෙස සමන්විත විය යුතුවේ. එහි

1) **මූලික හැඳින්වීම** - පර්යේෂණ සන්දර්භය, ගැටළු හා අරමුණු
2) **ක්‍රමවේදය** - භාවිත කරන ලද ක්‍රමවේදය පිළිබඳ කෙටි හැඳින්වීමක්

**3) ප්‍රතිඵල -** හඳුනාගත් ප්‍රතිඵල ඇතුළත් සාරාංශයක්

**4) නිගමන -** නිගමන හා වෙනත් අර්ථකථන

අන්තර්ගත කිරීම වැදගත් වේ. සංක්ෂිප්තය පර්යේෂණ පත්‍රිකාවේ විෂය මූලික නියෝජනයක් විය යුතු අතර පර්යේෂණ ලිපියේ නොමැති කිසිඳු කරුණක් අන්තර්ගත නොවිය යුතුය.

මුඛ්‍ය පද - පර්යේෂණ පත්‍රිකාවට උචිත මුඛ්‍ය පද 3 - 10 ක් අතර දැක්විය යුතුය.

**මධ්‍ය කොටස -**

හැඳින්වීම - සංක්ෂිප්තව, පැහැදිලි සන්දර්භයක් තුළ, හරවත් කරුණු ඉදිරිපත් කිරීමක් අවශ්‍යය ය. මෙහි දී අරමුණ, වැදගත්කම හා උපන්‍යාස පැහැදිලි කළ යුතුය. තෝරාගත් අධ්‍යයන පරාසයේ වර්තමාන තත්ත්වය හා යොදාගත් මුඛ්‍ය මූලාශ්‍ර පිළිබඳ සඳහන් කරන්න. පර්යේෂණ ගැටළු හා අරමුණු විස්තරාත්මකව දැක්විය යුතු අතර නිගමන පිළිබඳව ද හැඳින්වීමක් කළ හැකි ය. විෂයානුබද්ධ නොවන අයෙකුට වුවත් පර්යේෂණය පිළිබඳ පහසුවෙන් අවබෝධ කරගත හැකි පරිදි සකස් කළ හැකි නම් මැනවි.

ක්‍රමවේදය - යොදාගත් දත්ත හා ක්‍රමවේදයන් ප්‍රමාණාත්මකව දැක්විය යුතු අතර අදාළ විෂය සම්බන්ධ නව පර්යේෂකයන් සඳහා එය උපකාරී වැදගත් වේ. භාවිතකළ නව ක්‍රමවේද හා විධික්‍රම පැහැදිලි කළ අවශ්‍යය.

ප්‍රතිඵල - පර්යේෂණය තුළ දී හඳුනාගත් ප්‍රතිඵල සම්බන්ධව සංක්ෂිප්තව හා නිවැරදිව දැක්වීම අවශ්‍යය.

සාකච්ඡා - පර්යේෂණයේ ප්‍රතිඵල පාදක කරගනිමින්, ගොඩනැගිය හැකි අර්ථකථන මෙන්ම, ආරම්භයේ දී ගොඩනගාගත් උපන්‍යාස සාධනය හෝ නිෂේධනය කිරීම කෙරෙහි එමගින් ඇති බලපෑම පිළිබඳව ද සාකච්ඡා කළ යුතුය.

නිගමන හා සමාලෝචන - අවශ්‍ය නම් පමණක් දැක්විය හැකි අතර සමස්ත පර්යේෂණය පිළිබඳ සමාලෝචනයක් දැක්විය හැක.

**අපර කොටස -**

උපකාරානුස්මෘතිය - පර්යේෂණය සඳහා පරිපාලන, තාක්ෂණික, අධ්‍යාපනික හෝ මූල්‍යමය වශයෙන් දායකත්වය සැපයූ පුද්ගලයින් පිළිබඳ අන්තර්ගත කළ හැකිය.

මූලාශ්‍ර - හාවර්ඩ් උද්ධරණ (Harvard style) ක්‍රමවේදය භාවිතකළ යුතු වන අතර (වගු, සැලසුම්, ඡායාරූප සඳහා) මූලාශ්‍ර ලේඛනය පත්‍රිකාව අවසානයේ අවශ්‍යය.

වගු, සැලසුම් හා ඡායාරූප - පර්යේෂණයට යොදාගන්නා වගු, සැලසුම් හා ඡායාරූප ක්‍රමය Win.rar file format (minimum 1000 pixels width/height, or a

resolution of 300 dpi or higher) යටතේ යොමුකිරීමට කාරුණික වන්න. සියළුම ඇමුණුම් TIFF, JPEG ආකෘතියට අනුකූල විය යුතුය. ඇමුණුම් ලිපියේ අදාළ ස්ථානයේ දැක්විය යුතු අතර පිළිවෙළින් ඒවා අංක කළ යුතුය (ඡායාරූප අංක 01, වගු අංක 01, සැලසුම් අංක 01). ඇමිණුම් ශීර්ෂ සහිත විය යුතු අතර වගු සඳහා මාතෘකා මෙන්ම එහි අක්ෂර ප්‍රමාණය 8pt ට නොඅඩු විය යුතුය. MS Word මඟින් වගු නිර්මාණය කළ යුතු අතර වර්ණ ඡායාරූප ද ඇතුළත් කළ හැකිය.

**වැදගත් දින -**

| | |
|---|---|
| ලිපි ලබාදිය හැකි අවසන් දිනය | : 2021 **අප්‍රේල්** 28 |
| ලිපි තෝරාගත් / නොගත් බව දැනුම් දීම | : 2021 **ජුනි** 28 |
| සංස්කරණිත පිටපත ලබාගැනීම | : 2021 **සැප්තැම්බර්** 28 |
| සඟරාව මුද්‍රණය හා දොරට වැඩුම | : 2021 **ඔක්තෝබර්** 28 |

**ලිපි ලබාදීම -** දක්වා ඇති උපදෙස් අනුව සකසන ලද පර්යේෂණාත්මක ලේඛනයේ මෘදු පිටපත 2021.04.28 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන විද්‍යුත් ලිපිනයට හෝ තැපැල් ලිපිනයට ලැබීමට සලසන්න.

විද්‍යුත් ලිපිනය : ***editorjahs7@gmail.com***

තැපැල් ලිපිනය : **සංස්කාරක, පුරාවිද්‍යා හා උරුම අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය,**
**පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,**
**සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,**
**මිහින්තලේ.**